කලාප අධ්‍යාපන කාර්යාලය - කෑගල්ල
வலயக் கல்விக் காரியாலயம் – கேகாலை
Zonal Education Office - Kegalla

දෙවන වාර පරීක්ෂණය 2024 ශ්‍රේණිය 7
இரண்டாம் தவணைப் பரீட்சை 2024 தரம் 7
Second Term Test 2024 Grade 7


ගණිතය
Mathematics
கணிதம்

කාලය : පැය 2.00
Time : 2.00 Hours
நேரம்: 2.00 மணி

## I කොටස

- 1-20 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න .

01.



සමමිතික අක්ෂ භාවිතා කරමින් රූපයේ ඉතිරි කොටස සම්පූර්ණ කරන්න.

02. 2 , 5 යන ඉලක්කම් වලින් එක් සංඛ්‍යාවක් පමණක් දෙවරක් යොදා ගනිමින් ඉලක්කම් තුනක 9 න් බෙදෙන සංඛ්‍යාවක් ලියන්න.

03. ටොෆී පැකැට්ටුවක ස්කන්ධය 1Kg 125 g වේ. එවැනි පැකැට්ටු 8 ක ස්කන්ධය සොයන්න.

04. අගය සොයන්න

$10 - 2 \times 3$

05. $x = 3$ නම් $2x^2$ හි අගය සොයන්න.


06. "tomorrow" වචනයේ අකුරු කුලකය ලියන්න.

07.

$$\frac{3}{4} = \frac{75}{\square} = \square \%$$

භාග දශම සම්බන්ධතා ඇසුරින් හිස්තැන් පුරවන්න.

08. දී ඇති රූපය සම්බන්ධයෙන් නිවැරදි වගන්තියට √ ලකුණද වැරදි වගන්තියට × ලකුණ ද යොදන්න.



උත්තල බහු අස්‍රයක් වන අතර සවිධි බහු අස්‍රයකි ☐

අවතල බහු අස්‍රයක් වන අතර සවිධි බහු අස්‍රයකි නොවේ. ☐


09. පහත වර්ෂ අතරින් අධික අවුරුදු තෝරා යටින් ඉරක් අඳින්න.

(i)ක්‍රි.ව.1948 (ii) ක්‍රි.ව.1900 (iii) ක්‍රි.ව. 1800
(iv) ක්‍රි.ව.2022


10. $2\frac{4}{5}$ විෂම භාගයක් ලෙස ලියා දක්වන්න.

11. 2l 800ml ÷14 අගය සොයන්න.

**12.** රූපයේ දක්වා ඇත්තේ සමාන කොටස් වලට බෙදා ඇති සෘජුකෝණාස්‍රයකි. දී ඇති මිනුම් අනුව අඳුරු කර ඇති වර්ගඵලය සොයන්න.





13. දී ඇති කෝණ ඇසුරින් හිස්තැන් පුරවන්න.




$xyZ$ කෝණයේ ශීර්ෂය .................... වන අතර එය ..........................කෝණයකි.

PQRකෝණයේ ශීර්ෂය .................... වන අතර එය ...........................කෝණයකි.

14.




රූපයේ පරිමිතිය සොයන්න.

15. 45 හි ප්‍රථමක සාධක දෙක ලියන්න.


16. 16 පාදය දෙක වු දර්ශක අංකනයෙන් ලියන්න.

17. $P\hat{Q}R$ $75^0$ කෝණමාණය භාවිතා කරමින් පහත රේඛාව යොදා ගනිමින් අඳින්න.




18. "$x$ 3 න් ගුණකර 5ක් අඩු කරන්න" ගැලපෙන වීජීය ප්‍රකාශනය ලියන්න.

19. දී ඇති වෘත්තයේ විෂ්කම්භය නම් කරන්න.




20 පැත්තක දිග 12 Cm හා පළල 8 Cm වු සෘජුකෝණාස්‍රයක වර්ගඵලය සොයන්න.

## ii කොටස

- ii කොටසින් ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න

01. a) i . කාඩ්පත් වල ලියා ඇති වීජීය පද, නියත පද හා ගණිත කර්ම කිහිපයක් පහත දැක්වේ. ඒවා භාවිතයෙන් සමීකරණ දෙකක් ලියන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 32 | P | 2P | 12 | × | + | 4 | 18 | - |

(ල. 2)

ii. එම සමීකරණ වල ඇතුලත් වීජීය පදයක් හා නියත පදයක් ලියා දක්වන්න. (ල. 2)

b) $3p + 7 = 19$ සමීකරණයේ


i. ගණිත කර්ම දෙක ලියන්න.

ii. වීජීය පදයේ සංගුණකය ලියන්න. (ල. 2)

iii. $8p - 4 = 20$ සමීකරණය වීජීය ක්‍රමයෙන් විසඳන්න. (ල. 2)

iv. $5x - 2 = 13$ සමීකරණය අනුලෝම ප්‍රතිලෝම ගැලීම් සටහනක් භාවිතයෙන් විසඳන්න. (ල. 2)

c)





දී ඇති සෘජුකෝණාස්‍රයේ දිග ඒකක $a$ද පළල ඒකක $b$ ද වේ.

i . එහි පරිමිතිය $p$ නම් $p$ සඳහා සූත්‍රයක් $a$ හා $b$ ඇසුරෙන් ගොඩනගන්න. (ල. 1)

ii. $a = 12$ cm $b = 6$ cm නම් $p$ හි අගය සොයන්න. (ල. 1)

02. a)





i. AB රේඛාව ද්විපාර්ශ්වික සමමිති අක්ෂයක් වන සේ රූපයේ ඉතිරි කොටස සම්පූර්ණ කරන්න. (ල. 1)

ii. ඔබට ලැබුණු රූපයේ ද්විපාර්ශ්වික සමමිති අක්ෂ කීයක් තිබේද ? (ල. 1)

b) M ={KEÄNIWELI වචනයේ අකුරු }

i. M කුලකයේ අවයව සඟල වරහන් තුල ලියා දක්වන්න. (ල. 2)

ii .





වෙන් සටහන මගින් දී ඇති p කුලකය වෙනත් ආකාර දෙකකින් ලියා දක්වන්න. (ල. 2)

C) i. $16 = 4^{......}$ $16 = 2^{.....}$ දර්ශක දැනුම භාවිතයෙන් හිස්තැන් සම්පූර්ණ කරන්න. (ල. 2)

ii. $254^3$ ප්‍රකාශනය ගුණිතයක් සේ විහිදුවා ලියන්න. ($25 = 5^2$) (ල. 2)

iii. $x = 1$ හා $y = 2$ වන විට $x^6\ y^3$ හි අගය සොයන්න. (ල. 2)

03. a)




ඉහත තලරූප වලට හිමි අක්ෂරය යොදාගනිමින් පහත වගුවේ සුදුසු තැන් වලට යොදා හිස්තැන් පුරවන්න.

| | සම පාද ත්‍රිකෝණ | සමද්විපාද ත්‍රිකෝණ | විෂම ත්‍රිකෝණ |
|---|---|---|---|
| සුළුකෝණී ත්‍රිකෝණ | | | |
| ඍජුකෝණී ත්‍රිකෝණ | | | |
| මහ කෝණී ත්‍රිකෝණ | | | |

(ල.6)

b) i. පාද 4 ක් ඇති උත්තල බහු අස්‍රයක රූපයක් හා අවතල බහු අස්‍රයක රූපයක් බැගින් අඳින්න. (ල.2)


c) i. PQ= 7 cm වන සෙ 'සරල රේඛා ඛණ්ඩයක් අඳින්න. (ල.1 )

$P\hat{Q}R = 80^0$ හා DR=5cm වන පරිදි රේඛා ඛණ්ඩයක් අඳින්න. (ල.2 )

P හා R යා කර $P\hat{Q}R$ විශාලත්වය මැන ලියන්න. (ල. 1)

04 a) i. වරහන් තුළින් සුදුසු අගය තෝරා හිස්තැන් පුරවන්න.

$\frac{5}{8}$ යනු .................... ඒවා 5 කි. $\left(\frac{1}{2},\ \frac{1}{8},\ \frac{1}{5}\right)$ (ල. 1)

ii.  රූප සටහන මගින් නිරූපණය වන මිශ්‍ර සංඛ්‍යාව ලියන්න. (ල. 1)

iii. 2.75 හරය 100 වනසේ විෂම භාගයක් ලෙස ලියා දක්වන්න. (ල. 1)

iv. $\frac{13}{5}$ මිශ්‍ර සංඛ්‍යාවක් ලෙස ලියන්න. (ල. 1)

v. $1\frac{1}{4} + 1\frac{1}{3}$ සුළු කරන්න. (ල. 2)


vi. නෙත්මි තම ගවුමට ඇල්ලීම සඳහා ගෙන ආ රේන්ද මීටර් $4\frac{1}{3}$ ක ප්‍රමාණයෙන් ඇඳුමට භාවිතා කළපසු මීටර් $1\frac{1}{4}$ ක ප්‍රමාණයක් ඉතිරි විය. භාවිතා කළ රේන්ද ප්‍රමාණය භාගයක් ලෙස දක්වන්න. (ල. 2)

vii. $\frac{8}{25}$ දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න. (ල. 1)

vii. 5.231 × 25 සුළු කරන්න.

---

05




දිග 11cm වන ඍජුකෝණාස්‍රාකාර මිදුලක රෝස හා කානේෂන් මල් වැවීම සඳහා සමාන සමචතුරස්‍රාකාර කොටස් දෙකක් වෙන් කර ඇති අතර ඒ වට 1cm පළල පාරක් සකසා ඇත.

a) i. සමචතුරස්‍රාකාර කොටසක පැත්තක දිග සොයන්න. (ල. 2)
ii. ඍජුකෝණාස්‍රාකාර මිදුලේ පළල සොයන්න. (ල. 2)

b) i. රෝස මල් වවා ඇති කොටසේ වර්ගඵලය සොයන්න. (ල. 2)
ii. ඍජුකෝණාස්‍රාකාර මිදුලේ වර්ගඵලය සොයන්න. (ල. 2)
iii. පාර සඳහා වෙන් කර ඇති වර්ගඵලය කොපමණද? (ල. 2)

06 a) එක්තරා රටක යොමුවන විදේශ දුරකථන ඇමතුමක් සඳහා පළමු මිනිත්තුවට රු 15 ක්ද ඊට වැඩි වන සෑම මිනිත්තුවකටම රු.7 බැගින් අය කරයි.

මිනිත්තු 10ක ඇමතුමකට වැයවන මුදල සඳහා සංඛ්‍යාත්මක ප්‍රකාශනයක් ලියා සුළු කරන්න. (ල.2)

b) පහත දීඇති සංඛ්‍යා පිළිබඳව දී ඇති වගන්ති සත්‍ය නම් √ ලකුණද අසත්‍ය නම් × ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

448 5580 1122 1352

(a) කුඩාම සංඛ්‍යාව හතරෙන් බෙදේ. ( )

(b) විශාලම සංඛ්‍යාව 9 න් බෙදේ. ( )

(c) 1122 6 න් බෙදේ. ( )


(d) මෙහි ඇති සංඛ්‍යා සියල්ලම 4න් බෙදේ. ( ) (ල.4)

c) i. 72 ප්‍රථමක සාධක වල ගුණිතයක් ලෙස ලියන්න. (ල.1)

ii. 24 හා 36 හි ම.පො.සා. සොයන්න. (ල.2)

iii. 15 හා 18 හි කු.පො.ගු සොයන්න. (ල.2)

07 a) .




රූපයේ දැක්වෙන්නේ X හා Y නම් වෘත්ත දෙකක් එකිනෙක සම්බන්ධ වී ඇති ආකාරයයි.

i . X වෘත්තයේ කේන්ද්‍රය නම් කරන්න.

ii. X වෘත්තයේ අරය නම් කරන්න.

iii. X වෘත්තයේ විෂ්කම්භය නම් කරන්න. (ල.2 ×3 )

iv. B, E, C ලක්ෂ්‍යය යා කිරිමෙන් සමපාද ත්‍රිකෝණයක් ලැබෙන බව අමල් පවසයි. ඔබ එයට එකඟ වන්නේද ? හේතුව සඳහන් කරන්න. (ල.2)

- ඉහත CEB ත්‍රිකෝණයේ පරිමිතිය 15cm වේ නම්

v. X වෘත්තයේ විෂ්කම්භයේ දිග සොයන්න. (ල.3 )

vi. පාද වල දිග අනුව වර්ගීකරණය කළවිට E,C හා D ලක්ෂය යාකිරීමෙන් ලැබෙන්නේ කුමන වර්ගයේ ත්‍රිකෝණයක්ද? (ල.1)


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න